සබරගමුව පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
சபரகமுவ மாகாண கல்வித் திணைக்களம்
Sabaragamuwa Provincial Department of Education

| | |
|---|---|
| **තෙවන වාර පරීක්ෂණය 2020** | **11 ශ්‍රේණිය** |
| **மூன்றாம் தவணைப் பரீட்சை 2020** | **தரம் 11** |
| **Third Term Test 2020** | **Grade 11** |

| | | |
|---|---|---|
| **ඉස්ලාම් ධර්මය** | **I** | **පැය එකයි** |
| **இஸ்லாம் சமயம்** | **I** | **ஒரு மணித்தியாலம்** |
| **Islam** | **I** | ***One hour*** |

**සියලුම ප්‍රශ්න වලට පිළිතුරු සපයන්න පැය තුනයි**

**1-4 තෙක් ප්‍රශ්න වලට වඩාත් නිවැරදි පිළිතුර යටින් ඉරක් අඳින්න.**

**1)** ඇත් සේනා සිදුවීමෙන් කොපමණ කලකට පසු කඃබාවේ ප්‍රතිසංස්කරණ කටයුතු ඇරඹුණි ද?

1) අවුරුදු 20කට පසු  2) අවුරුදු 40කට පසු

3) අවුරුදු 30කට පසු  4) අවුරුදු 10කට පසු

2) ඔටුවන් 25 ක් හිමි කෙනෙකු දිය යුතු zසකාත් ප්‍රමාණය

1) එළුවන් දෙදෙනෙකු  2) වසරක් වයසැති ඔටු දෙනක්

3) දෙවසරක් වයසැති ඔටු දෙනක්  4) එළුවන් 4දෙනෙකු

3)"සම්පූර්ණ නොකර අතහැර දමනු ලැබූ ඉස්ලාම් නම් ගොඩනැගිල්ලේ හිඩැස පිරවීමට පැමිණි තැනැත්තා මම වෙමි."මෙම ප්‍රකාශය කළේ

1) ඊසා (අලෛ) තුමා  2) මූසා (අලෛ) තුමා

3) ඉබ්රාහිම් (අලෛ) තුමා  4) මුහම්මද් නබි තුමා

4) දිවිරීම,පිළිම වන්දනය,සාත්තර බැලීම,ආගමික වගකීම්, වලට විහිළු කිරීම යනාදී ක්‍රියා වලින් කුෆ්ර් ඇති වන ක්‍රියා නොවනුයේ

1) 1 සහ 4 ය.  2) 1-2 ය  3) 1සහ 3ය.  4) 2-4 ය

05) නුඹ ආදේශ තබන්නේ නම් නුඹගේ කුසල් නිෂ්ඵල වනු ඇත.තවද පරාජිතයන්ගෙන් කෙනෙක් වන්නේම යැයි ( නබි මුහම්මද්) නුඹට පෙර සිටි අයද නියත වශයෙන්ම වහී පහළ කරනු ලැබී ය. මෙම අල්කුර්ආන් ආයතයෙන් අවධාරණය කරනුයේ

1) නබිවරු සියල්ලෝම තව්හීද් පිළිගෙන ජනයාව කැඳවූ බවය.
2) සියල්ලෙහි මැවුම්කරු අල්ලාහ් බවයි.
3) යහ ක්‍රියා අනුමත කරලීමට තව්හීද් අවශ්‍යාවශ්‍යම කොන්දේසියක් බවයි.
4) තව්හීද් නොපිළිගන්නාවුන්ට ස්වර්ගය හරාම් කර ඇති බවය.

06) නබිවරුන්ට පසුව ගෞරවයට පාත්‍ර වියයුතු අය වනුයේ

1) වලීවරු  2) මලායිකාවරු  3) සූෆිවරු  4) සහාබාවරු

07) අල්ලාහ් තමන්ට යහපත් දේ ලබාදීමට කැමති වන අය පරීක්ෂාවට ලක් කරන යහගුණාංග

1) දැනුම  2) ඉවසීම  3) අධ්‍යාත්මය  4) කරුණාව

08)පහත අරාබි යෙදුම් වල අර්ථයන් ගැලපූවිට සුදුසු පිළිතුර වනුයේ

1) අල්ම:රීෆා — A ඉවසීම

2) අත්තවක්කුල් — B ගැළපීම

3) අස්සබ්ර් — C වගකීම පැවරීම

4) අර්රිලා — D දැනුම

1) BACD 2) ABCD 3) DCAB 4) CABD

09) භාෂා නිපුණත්වය ශ්‍රේෂ්ඨත්ත්වයක් ඉසි ලූ යුගයක පහළ වූ දහම

1) තවුරාත් 2) ෆුර්කාන් 3) ඉන්ජීල් 4) සබූර්

10) උමර් බින් අබ්දුල් අසීස් තුමා හදීස් එක් රැස් කිරීමට අණ කළ ඉමාම් වරයා

1) සෙද් ඉබ්නු සාබිත් තුමා 2) ඉමාම් ෂිහාබ්දීන් සුහ්රි තුමා

3) ඉමාම් බුහාරි (රහ්) තුමා 4) ඉමාම් අබු හුරෙරෝ තුමා

11) මුජ්තහීද්වරු උත්සාහයක යෙදුනේ

1) හදීස් එක්රැස් කිරීමටය 2) අල්කුර්ආනය ඉගැන්වීමටය

3) ඉජ්තිහාද් ලබාදීමටය 4) හදීස් ගොනු කිරීමටය

12) තබඋත්තාබිරීන්වරුන්ගේ කාලය පිළිබඳ කියවෙන නිවැරදි ප්‍රකාශය වනුයේ

1) ෆික්හු කලාව තනි කලාවක් බවට දියුණුවට පත් වනුයේ මෙකලය
2) ෆික්හු නීති කලාව බිහි විය.
3) මුජ්තහීද්වරු ෆික්හු පංති පැවැත්වූ හ.
4) ෆික්හු කලාවේ ස්වර්ණමය යුගය මෙකලයි.

13) අරාබි වචනයන්හි අර්ථයන් නිවැරදිව ගැලපූ විට ලැපෙන සුදුසු පිළිතුර වනුයේ

1) කාලි — A ආණ්ඩුකාරයා
2) කාතිබ් — B භාණ්ඩාගාර භාර කරු
3) වාලි — C ප්‍රධාන නඩුකාර තුමා
4) සාහිබු බෛතුල්මාල් — D ප්‍රධාන ලේකම්

1) BADC 2) CDAB 3) ADCB 4) BCAD

14) හිජ්රි 35වන වසරේ යුදෙව්වෙකු විසින් ඝාතනයට ලක් වූ කලීෆා වරයා වනුයේ

1) උස්මාන් (රලි) තුමා 2) අබුබක්කර් (රලි) තුමා 3) උමර් (රලි) තුමා 3) අලි (රලි) තුමා

15) ඉතිහාසඥයෙකු වූ ඉබ්නු සහ්රයාර්ගේ ග්‍රන්ථය වනුයේ

1) ෆුතූහුල් බුල්දාන් 2) අජාඉබුල් හින්ද්

3) අසන්බෙ සරත්තිරම් 4) ඉස්ලාම් නේෂන්

16) ලංකාවේ ප්‍රකාශයට පත් පළමු දෙමළ නවකතාවේ රචකයා වනුයේ

1) ටි.බී ජායා තුමා 2) රාසික් ෆරීද් තුමා
3) සිද්දි ලෙබ්බෙ තුමා 4) අගාර් මුහමද් තුමා

17) විවාහ ගිවිසුමේ කොන්දේසි අසම්පූර්ණ වීම නිසා කඩවන විවාහය හඳුන්වනුයේ

1) ඉලා උ 2)ලිහාර් 3) ෆස්කු 4) තලාක්

18) ස්වාමි පුරුෂයා විසින් භාර්යාවට ලබා දෙන වියදම වනුයේ

1) ගනීමත්  2) සකාත්  3) නෆකා  4) මහර්

19) අසදුල්ලාහ් යනුවෙන් නබි (සල්)තුමා ප්‍රශංසා කල කලීෆාවරයා වනුයේ

1) අබුබක්කර් (රලි)  2) උමර් (රලි)  3) උස්මාන් (රලි)  4) අලි (රලි)

20) අල්කුරානයේ 'මුහ්සන් ' යන වචනය භාවිතා කරනුයේ

1) අවිවාහකයන්ට  2) අවිවාහකයෙකුට

3) විවාහකයන්ට  4) ආබාධිතයන්ට

21) අල් මාඋන් මුත්ලක් යනුවෙන් හඳුන්වනුයේ

1) නජිස් ජලයයි  2) පරිහරණය කරන ලද ජලයයි

3) අධික ජලයයි  3) අල්ප ජලයයි

22) සකර් නම් නිරයට යවනු ලබනුයේ කුමන වගකීම පැහැර හැරීමෙන්ද?

1) කලිමා  2) සලාත්  3) Zසකාත්  4) අස්සවුම්

23) 'තමාව ප්‍රශංසා කරන්නාගේ ප්‍රශංසාවට අල්ලාහ් සවන් දෙන්නේය' යන අර්ථයෙන් යුතුව එළඹෙන සලාතයේ ඉරියව්ව වනුයේ

1) සුජූද්  2) රුකූඋ  3) ඉෘතිදාල්  4) මැද හිඳුම

24) පවුල නඩත්තු කිරීම, දෙමාපියන්ට සැලකීම යනාදී කරුණු අඩංගු වනුයේ

1) සුන්නත් මුඅක්කදා  2) ෆර්ලු කිෆායා  3) සුන්නත්  4) ෆර්ල් අයින්

25) වැඩිම සුහුෆ් ප්‍රමාණයක් ලද නබිවරයා වන්නේ

1) ඉද්රිස් නබි  2) ෂීද් නබි  3) මූසා නබි  4) ආදම් නබි

26) පරලොව ජීවිතය සම්බන්ධ සියලු කරුණු අඩංගු කොටස වනුයේ

1) අන්නුබුව්වාත්  2) අර්රුහානිය්යාත්

3) අස්සම්ඉයියාත්  4) අල්ඉලාහිය්යාත්

27) ඊමාන් සමග අමල් සම්බන්ධව අල්කුර්ආනයේ සඳහන් වන ස්ථාන ගණන

1) 80  2) 90  3) 60  4) 70

28) යමෙක් සුබහ් සලාතයට පසු .................පාරායණා කරන්නේද ඔහුට කුසල් 10ක් ලැබේ. අකුසල් 10ක් විනාශ වේ.ඔහුව තත්ත්වයන් 10කින් උසස් කරයි.තවද, එදින සියලු නපුරෙන් සහ ෂෛතාන්ගේ හානියෙන් ඔහුව රැකගනී.හිස්තැනට සුදුසු පිළිතුර වන්නේ

1) කලිමා තව්හීද්  2) කලීමා තව්හීද්

3) කලිමා ෂහාදා  4) කලිමා රද්දුල් කුෆ්ර්

29) අදබ්,ආදාබ් යන අරාබි පද භාවිතා කරනුයේ

1) නබි තුමාගේ හාස්කම් පෙන්වීමටය  2) දේවගැත්තන්ගේ ගුණාංග දැක්වීමටය

3) ඉවසීමෙහි දායාද පෙන්වීමටයි.  4) යහගුණාංග දැක්වීමටයි.

30) අබුබක්කර් (රලි) තුමා තම පෞද්ගලික ධනය පරිත්‍යාග කළ සටන වනුයේ

1) කන්දක් 2) තබුක් 3) බද් ර් 4) උහුද්

31) සිතෙහි ඇති පාපී ක්‍රියා ඉවත් කර ගැනීමට හොඳම ක්‍රියාවලිය

1) සුහුද් 2) වරඋ 3) තව්බා 4) ඉඛ්ලාස්

32) හදීස් අයත් වන කොටස වනුයේ

1) වහී මත්ලූව් 2) වහීගෛරු මත්ලූව් 3) සුන්නත් 4) සුන්නත් මුඅක්කදා

33) ඉජ්මාඋල් කෞලි ලෙස හඳුන්වන ඉජ්මා වර්ගය

1) ඉජ්මාඋල් අක්සරිය්‍යා 2) ඉජ්මාඋස් සරිහ්

3) ඉජ්මාඋස් සුකුති 2) ඉජ්මාඋස් සුන්නත්

34) ගෝත්‍ර හැඟිමට අදාළ අරාබි වචනය

1) අක්ලීයා 2) ජහමියියා 3) අව්ලිය්‍යා 4) අසබිය්‍යා

35) ජාහිලිය්‍යා යුගයේ අල්ලාහ්ව විශ්වාස කළ අයව හඳුන්වනුයේ

1) හනීෆ්වරු 2) කුරෛෂිවරු 3) හාෂිම්වරු 4) කාෆිර්වරු

36) සීරත් රසූලුල්ලාහ් යන ග්‍රන්ථයේ කතුවරයා වනුයේ

1) මුහම්මද් අබ්දුල් මලික් බින් හිෂාම් 2) වලීද් ඉබ්නු මුගීරා

3) මුහම්මද් බින් ඉස්හාක් 4) ඉමාම් සමාහ්ෂරි

37) කාබිල්ගේ රැකියාව වූයේ

1) ගොවිතැන 2) සතුන් ඇති කිරීම

3) තණ වගාව 4) මැටි බඳුන් නිර්මාණය

38) මදීනා සම්මුතිය හඳුන්වා දුන්නේ

1) ඉබ්රාහිම් නබි 2) අබුබක්කර් (රලි)

3) මුහම්මද් නබි 4) අලි (රලි)

39) ඉමාම් ෂීබවෛ තරුණ වියේදී දස්කම් දැක්වූ ක්ෂේත්‍රය

1) ෆික්හ් 2) හදීස් 3) සාහිත්‍ය 4) අරාබි ව්‍යාකරණ

40) නබි (සල්) තුමාගේ හදීසයකට අනුව මිනිසුන් නොසැළකිලිමත් අල්ලාහ්ගේ දයාද දෙකින් එකක් විවේකය වන අතර අනික

1) පිරිසිදුකමය 2) ඥානයයි

3) නිරෝගී කමය 4) මානසික යෝග්‍යතාවයයි